# IV වන දකුණු ආසියානු සනීපාරක්ෂක සමුළුව

*''සනීපාරක්ෂාව ජීවන තත්ත්වය උසස් කරනු ලබයි''*

අප්‍රේල් 4 සිට 7 දක්වා 2011
කොළඹ, ශ්‍රී ලංකාව

# කොළඹ ප්‍රකාශණය

අප ඇෆ්ගනිස්තානය,බංග්ලාදේශය,භූතානය,ඉන්දියාව,මාලදිවයින,නේපාලය,පකිස්ථානය හා ශ්‍රී ලංකාව යන රටවල නියෝජිතයන්ගේ ප්‍රධානීන් වශයෙන් 2001 අප්‍රේල් මස 4 වැනිදා සිට 7 වනදා දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ පැවැත්වූ විවිධ අමාත්‍යවරු,ජ්‍යෙෂ්ඨ සිවිල් සේවකයන්, බිම් මට්ටමේ ක්‍රියාකාරීන්, ප්‍රජාවන්හි සාමාජිකයන්, විවිධ ආයතනවල වෘත්තීයවේදීන්, සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන හා සංවර්ධන සහකරුවන්, පුද්ගලික අංශය සහ පාසැල් ළමුන් සහභාගී වූ IV වන දකුණු ආසියානු සනීපාරක්ෂක සමුළුවෙහිදී,

1) දකුණු ආසියානු කලාපය තුල සනීපාරක්ෂක තත්ත්වය ඉතා අර්බුද තත්ත්වයක පවතින බව සිහිකල අතර,විවෘත ස්ථාන වල මලපහකිරීම හා අනෙකුත් නොදියුණු සනීපාරක්ෂක තත්ත්වයන් යටතේ ජීවත්වන පිරිස් ඉතා විශාල බව පෙන්වා දුනි. තවද ඉන්දියාවේ දිල්ලි නුවර පැවති තෙවන SACOSAN සමුළුවෙන් පසුව මේ දක්වා 750000 පමණ ළමුන් පිරිසක් මෙම කළාපය තුල පවතින පාචන තත්ත්වයන් නිසා මියගිය අතර මෙම රෝගය දුර්වල සනීපාරක්ෂක තත්ත්වය හා බෙහෙවින් බැඳී පවතී.

2) ''සනීපාරක්ෂක'' සංවර්ධනය සඳහා ප්‍රවේශ මාර්ගයක් ලෙසත්, ප්‍රජාවන් බලගැන්වීමට සනීපාරක්ෂාව යොදාගැනීමට ඇති හැකියාව පිළිබඳවත් හඳුනා ගන්නා ලදී.

3) සනීපාරක්ෂාව පිලිබඳ අර්බුද වලට මුහුණදීම සඳහා දේශපාලන ප්‍රවේශය පවත්වා ගැනිමට SACOSAN ක්‍රියාවලිය තහවුරු කිරීම හා නවදිල්ලි ප්‍රකාශය(2008 නොවැම්බර්),ඉස්ලාමාබාද් ප්‍රකාශය(2006 සැප්තැම්බර්)හා ඩකා ප්‍රකාශය (2003 ඔක්තෝම්බර්) යන ප්‍රකාශ මගින් පෙන්වා දෙනු ලැබූ සනීපාරක්ෂාව හා සම්බන්ධව පස් අවුරුදු ගෝලීය ක්‍රමෝපායට සහය පලකිරීම සහ සනීපාරක්ෂාව පිලිබඳ යහපත් ගුණාංග හා ප්‍රතිපත්තීන් නැවත තහවුරු කිරීම,

4) විවිධ ප්‍රතිපත්තීන් හා වැඩසටහන් හරහා චිරස්ථායි සනීපාරක්ෂක තත්ත්වයන් දකුණු ආසියානු කළාපයේ සැමට උදාකරලීම වෙනුවෙන් අපගේ ඇති කැපවීම නැවත අළුත් කරලීම හා නැවත එම ජනතාව වෙනුවෙන් ආයොජනය,

අපගේ කැපවීම යාවත්කාලීන කිරීම වෙනුවෙන් තවදුරටත් අප එකඟතාව හා කැපවීම ප්‍රකාශ කලෝය.

i සනීපාරක්‍ෂාව සඳහා ඇති අයිතිය'' යන එක්සත් ජාතීන්ගේ යෝජනාව සැලකිල්ලට ගෙන, විවිධ වැඩසටහන්, ව්‍යාපෘතීන් හා ප්‍රතිපත්තීන් සාක්ෂාත් කරගැනිම වෙනුවෙන් දිගින් දිගටම කටයුතු කිරිම.

ii පසුගිය SACOSAN සමුළුවල යෝජනා වූ අරමුණු සාක්ෂාත් කරගැනීමෙහි ලා කාලරාමු සැලසුම් සංවර්ධනය කිරිම හා ඒවා ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සම්පත් දායකත්වය සැපයීම.

iii අන්තර්ගනයට අනුකූල වූ,සමානාත්මක හා සියළුම ගුණාංග ඇතුලත්වන පරිදි විවිධ සනීපාරක්ෂක වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම.මෙහිදී දුෂ්කර හා නාගරික යන කොට්ඨාශ දෙකටම අයත් අති දිලිදු හා ඊට සමාන සමාජ තත්ව වල පසුවන ජනතාව හා මෙවැනි වැඩසටහන් මගින් වඩාත් ප්‍රතිලාභ ලැබිය හැකි කොටස් ඉලක්කගත කල වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුය. තවද මෙම ක්‍රියාවලයේදි පරිසරය සුරැකීම හා සම්බන්ධ හදිසි තත්ව වලට ප්‍රතිචාර දැක්වීම සදහා අවධානය යොමුකල යුතුය.

iv.WASH in school'' යන තේමාව හා සම්බන්ධව සියළුම නව පාසල් හා දැනට පවතින පාසල් වල සෑම අධ්‍යාපන මට්ටමකම පසුවන පාසල් වල ළමුන් වෙනුවෙන්, පාසල් වල ළමුන් වෙනුවෙන් හිතකාමි වුද ,ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් වෙනුවෙන් වෙන් වෙන් වුද, ගැහැණු ළමුන්ගේ ඔසප් චක්‍රය හා සම්බන්ධව සෞඛ්‍යාරක්ෂාව කලමනාකරණය වෙනුවෙන් වෙන් වු යන අරමුණු සාක්ෂාත් කර ගැනිම සදහ ඇති අවධානය වැඩිකිරීම.

v.''සනීපාරක්‍ෂාව'' යන විෂයය සම්බන්ධීකරණයේදි ඒ හා සම්බන්ධ වු සියළුම පාර්ශවකරුවන් (ආර්ථික,සෞඛ්‍ය,ප්‍රජා සෞඛ්‍ය,පාරිසරික,ජලය,අධ්‍යාපනය ,ස්ත්‍රී-පුරුෂ භාවය,හා ප්‍රාදේශිය පාලන, ප්‍රජා හා ප්‍රාදේශිය වශයෙන් වු පාලන මට්ටම් යන අංශ වලට සීමා නොවු )ඇතුලත් වන පරිදි එක් දේශිය ආයතනයක් පිහිටුවාලිම.

vi.සනීපාරක්ෂාව වෙනුවෙන් රාජ්‍ය අංශයේ විශේෂිත වු අයවැය මගින් වු මුදල් වෙන්කිරීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම.

vii.සනිපාරක්ෂාව ප්‍රවර්ධනය වෙනුවෙන් වෙන් වු ප්‍රතිපාදන කාලයත් සමග වැඩි කිරීම.

viii.දිලිදු ජනතාව ආරක්ෂා කර ගනිමින් විවිධ ප්‍රජාවන්ගේ සනිපාරක්ෂාව වෙනුවෙන් ඔවුනොවුන් ඉදිරිපත් කරන විකල්ප හා ඒ සදහා තම තමන් කරනු ලබන ආයෝජන වලට ඉඩසලසන ප්‍රතිපත්තියක් හා වැඩසටහන් දිරිගැන්වීම සදහා ''ජනතාවගේ ස්වයං දායකත්වයේ ඇති වැදගත්කම'' හදුනා ගැනීම.

ix.සියළුපාර්ශව කරුවන් විසින් තෝරාගනු ලැබු නිරීක්ෂණ යාන්ත්‍රණයක් ගොඩනැගීම හා එහි කාර්‍යයන් හා වගකීම් පැහැදිලිව ඉදිරිපත් කිරීම, තවද ඒකමතිකව පිලිගනු ලැබූ පොදු දර්ශක මගින් ගෘහස්ථ හා ප්‍රජා යන සියළුම මට්ටම් වල ක්‍රියාවලිය හා ඒවායේ ප්‍රතිපල අධීක්ෂණය හා අවසාන වශයෙන් ප්‍රමාදයකින් තොරව අවධානමට හා කඩඉම් වල පසු වන සමාජ කොටස් වල ප්‍රතිපල වර්ගීකරණයට එමගින් ඉඩසැලසීම.

x. නිරීක්ෂණ යාන්ත්‍රණයෙහි විශේෂ ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු දර්ශක(WASH in schools, අත්සේදීම, හා ඔසප් චක්‍රය හා සම්බන්ධ සනීපාරක්ෂාව) ඇතුලත් කිරීම.

xi.සනීපාරක්ෂාව හා සම්බන්ධ සියළුම වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම සදහා (ප්‍රජා සහ මූලික සමාජ මට්ටම් වල)''සහභාගීත්වය'', ''සමාජ වගකීම් පිළිබද යාන්ත්‍රණය'' වැනි අංශයයන් තෝරා ගැනීම සිදුකල යුතු අතර ඒවා ක්‍රියාවට නැංවීමේදි දුෂ්කරතාවයට මුහුණ දුන් හා සීමාකාරි තත්ව වල පසුවන කණ්ඩායම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කල යුතුවේ.

xii. සනීපාරක්ෂාව පවත්වා ගැනීම හා ක්‍රියාවට නැංවීමේදී ශක්‍යතාව ගොඩ නැංවීම හා සවිමත් කිරීම (මෙයට උසස් අධ්‍යාපන පහසුකම් වල ආයෝජනය, සමීක්ෂණ හා සංවර්ධනය, දැනුම හුවමාරුව හා සහයෝගීතාව වර්ධනය යන අංශ ඇතුලත්ය.)

xiii) දෙවසරකින් පසුව අප නේපාලයේ හමුවන තෙක් SACOSAN ක්‍රියාවලියේ කාර්‍යක්ෂමතාව පවත්වාගෙන යාම සහතික කිරීම වෙනුවෙන් ඉහත සඳහන් SACOSAN අරමුණු ඉටු නොවන හෝ ඒවාට එරෙහි තත්ත්ව පවතින අවස්ථාවන්හි එම තත්ත්ව වාර්තාකරණය හා මුදල්, සෞඛ්‍යය, අධ්‍යාපනික හා අනෙකුත් අදාල අමාත්‍යාංශවල නියෝජිතයන්ට ඉදිරි සමුළුවලට ආරාධනය කිරීම.

xiv SACOSAN III සමුළුවේදී පිහිටුවා ගනු ලැබූ දිල්ලි මාර්ග සටහන(Delhi roadmap)නිරූපනය හා ක්‍රියාවට නැංවීමට ස්වයං වාර්තාකරණය හා දේශීයව හඳුනා ගනු ලැබූ ක්‍රියාවලිය හරහා සහය පලකිරීම, තවද අන්තර් රාජ්‍ය ක්‍රියාකාරී කණ්ඩායමේ වල (Inter Country Working Groups) ප්‍රගති සමාලෝචනය සඳහා වාර්ෂික රැස්වීම් සංවිධානය (SACOSAN I හි පිහිටවනු ලැබූ පියවරකි.)

## අප තවදුරටත්

විවිධ සංවර්ධන බැංකු, සහයෝගය ලබා දීමට ඉදිරිපත් වන බාහිර ආයතන හා පෞද්ගලික අංශය වෙත සනීපාරක්ෂාව ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූලයාධාර ගොඩනැංවීමට අප දරණ ප්‍රයත්නය වෙනුවෙන් අපහට ලබා දෙන ආධාර වැඩිකරදෙන ලෙස ඉල්ලා සිටිමු.

සාර්ක් සමුළුවෙහි යෝජනා වලට SACOSAN හි නිර්දේශ (සනීපාරක්ෂාව හා සම්බන්ධ විධිවිධාන)ඇතුලත් කිරීම අවශ්‍ය වේ.

වර්ෂ 2015 වනවිට ලඟාකර ගතයුතු සංවර්ධන අරමුණු සම්පාදනයේදී එක්සත් ජාතීන් විසින් සනීපාරක්ෂාව හා සම්බන්ධ යථා තත්ත්වය සැලකිල්ලට ගතයුතු අතර WHO/UNICEF සංවිධාන වල ඒකාබද්ධ නිරීක්ෂණ වැඩසටහන් වල නවඅංග එක්කිරීම හා සම්බන්ධව අවධානය යොමුකිරීම අවශ්‍යය වේ.

එහිදී දකුණු ආසියානු කලාපය තුල විශාල වශයෙන් භාවිතාවන ප්‍රජා සහ පොදු වැසිකිළි සම්බන්ධව අවධානය යොමුකිරීම අවශ්‍යය වේ.

අප, ශ්‍රී ලංකා රජය හා ජනතාව වෙත SACOSAN සමුළුව සාර්ථකව පැවැත්වීමට දැක්වූ දායකත්වය හා ඔවුන්ගේ සියළු ආගන්තුක සත්කාර හා පිලිගැනීම් වෙනුවෙන් හෘදයාංගම ස්තූතිය පිරිනමමු.

**කොළඹ, ශ්‍රී ලංකාව, 2011 අප්‍රේල් 06.**

*පරිවර්තනය: පරිසර යුක්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාව*